14
පාඩම
चतुर्दशः पाठः

# විභක්ති - VI
## (පඤ්චමී විභක්තිය)

### පඤ්චමී විභක්තිය

1. आकाश = අහස    आकाशात् = අහසින් (වෙන්වීම්)

१ आकाशात् जलं पतति । - අහසින් ජලය වැටෙයි.

२ वृक्षात् पत्राणि पतन्ति । - ගසින් කොළ වැටේ.

३ अहं पाठालयात् गृहम् आगच्छामि । - මම පාසලෙන් ගෙදර එමි.

### අවධානයට

ඉහත පාඩම්වල වරනැගුණු ශබ්ද පඤ්චමී විභක්තියේ වෙනස් ව වරනැගෙන අයුරු වටහාගන්න.

| शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक (पु) | बालकात् | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාගෙන් | ළමයින් දෙදෙනාගෙන් | ළමයින්ගෙන් |
| कवि (पु) | कवेः | कविभ्याम् | कविभ्यः |
| | කවියාගෙන් | කවියන් දෙදෙනාගෙන් | කවියන්ගෙන් |
| साधु (पु) | साधोः | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාගෙන් | සත්පුරුෂයන් දෙදෙනාගෙන් | සත්පුරුෂයන්ගෙන් |
| पितृ (पु) | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| | පියාගෙන් | පියවරුන් දෙදෙනාගෙන් | පියවරුන්ගෙන් |
| वनिता (ස්ත්‍රී) | वनितायाः | वनिताभ्याम् | वनिताभ्यः |
| | වනිතාවගෙන් | වනිතාවන් දෙදෙනාගෙන් | වනිතාවන්ගෙන් |
| पुष्प (න) | पुष्पात् | पुष्पाभ्याम् | पुष्पेभ्यः |
| | මලෙන් | මල් දෙකෙන් | මල්වලින් |

## 14.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල **පඤ්චමී විභක්ත්‍යන්ත** පද ලියා දක්වන්න.

| | शब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|
| උදා: | गज | - | गजात् | गजाभ्याम् | गजेभ्यः |
| १ | नर | - | .......................... | .......................... | .......................... |
| २ | मुनि | - | .......................... | .......................... | .......................... |
| ३ | सूनु | - | .......................... | .......................... | .......................... |
| ४ | अलि | - | .......................... | .......................... | .......................... |
| ५ | इन्दु | - | .......................... | .......................... | .......................... |
| ६ | जामातृ | - | .......................... | .......................... | .......................... |
| ७ | पीठ | - | .......................... | .......................... | .......................... |
| ८ | बन्धु | - | .......................... | .......................... | .......................... |
| ९ | जेतृ | - | .......................... | .......................... | .......................... |
| १० | वसुधा | - | .......................... | .......................... | .......................... |

2. පහත දැක්වෙන **පඤ්චමී විභක්ත්‍යන්ත** පදවල ඒකවචන, බහුවචන බව හා තේරුම ලියා දක්වන්න.

| | | | වචනය | අර්ථ |
|---|---|---|---|---|
| १ | शिखरात् | - | .................................. | .................................. |
| २ | पुष्पेभ्यः | - | .................................. | .................................. |
| ३ | इभारेः | - | .................................. | .................................. |
| ४ | भल्लूकाभ्याम् | - | .................................. | .................................. |
| ५ | गिरेः | - | .................................. | .................................. |
| ६ | सेतोः | - | .................................. | .................................. |
| ७ | तरुभ्यः | - | .................................. | .................................. |
| ८ | सवितुः | - | .................................. | .................................. |
| ९ | पातृभ्याम् | - | .................................. | .................................. |
| १० | लतायाः | - | .................................. | .................................. |

## 14.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නඟන්න.

१ अहं गृहात् निर्गच्छामि ।
२ पाणेः चषकः अपतत् ।
३ भिन्नघठात् अम्बु स्रवति ।
४ गिरिशिखरात् उपलानि पतन्ति ।
५ कपयः तरोः अवरोहन्ति ।
६ सज्जनाः अनृतात् विरमन्ति ।
७ मूषिकः बिलात्   निष्क्रामति ।
८ शिशवः पाठालयात् गृहम् आगच्छन्ति ।
९ बालिकाः शालायाः निष्क्रामन्ति ।
१० जनाधिपः देशान्तरात्  आगच्छति ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න

1. ඇමතිතුමා **ප්‍රාසාදයෙන්** බසියි.
2. ඇතා **කන්දෙන්** බසියි.
3. භික්ෂූහු **නගරයෙන්** කැලයට ගියහ.
4. කුකුළා **ගසෙන් බසී.**
5. කුරුල්ලෝ **කූඩුවලින්** නික්මෙති.
6. නැවියෝ **නැවෙන්** ගොඩබසිති.
7. ගැල්කරුවා **ගැලින්** ගොනුන් දෙදෙනා මුදයි.
8. වෙළෙන්දෝ **ගමින්** ගමට සැරිසරති.
9. වනිතාවෝ **සභාවෙන්** නික්මෙති.
10. පුතණුවනි, **කඳු මුදුනින්** නොවැටෙන්න.

### අභ්‍යාස සඳහා උපකාරක පද

**අභ්‍යාස සඳහා උපකාරක පද**

ක්‍රියාපද

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| आगच्छति | - | පැමිණෙයි | निष्क्रामति | - | නික්මෙයි | मुञ्चति | - | මුදයි |
| अवरोहति | - | බසියි | सञ्चरति | - | සැරිසරයි | रक्षति | - | රකියි |
| उत्तरति | - | ගොඩබසියි | त्रस्यति | - | තැතිගනී | विरमति | - | වැළකෙයි |
| निर्गच्छति | - | නික්මෙයි | वदति | - | කියයි | स्रवति | - | වැගිරෙයි |

නාමපද

| | | | |
|---|---|---|---|
| इभ (පු) | - ඇතා | भल्लूक (පු) | - වලසා |
| कुक्कुट (පු) | - කුකුළා | भिक्षु (පු) | - භික්ෂුව |
| गिरिशिखर (පු) | - කඳුමුදුන | भिन्नघट (පු) | - බිඳුණු කළය |
| जानाधिप (පු) | - ජනපති | वाणिज (පු) | - වෙළෙන්දා |
| नाविक (පු) | - නැවියා | शाकटिक (පු) | - ගැල්කරුවා |
| पण्डित (පු) | - පණ්ඩිතයා | शृगाल (පු) | - සිවලා |
| पाठालय (පු) | - පාසැල | सज्जन (පු) | - සත්පුරුෂයා |
| अरि (පු) | - සතුරා | इन्दु (පු) | - සඳ |
| अलि (පු) | - බඹරා | सेतु (පු) | - ඒදණ්ඩ |
| इभारि (පු) | - සිංහයා | सूनु (පු) | - පුතා |
| गिरि (පු) | - කන්ද | जेतृ (පු) | - දිනන්නා |
| मुनि (පු) | - මුනිවරයා | पातृ (පු) | - රකින්නා |
| पाणि (පු) | - අත්ල | सवितृ (පු) | - හිරු |
| अनृत (න) | - බොරුව | राष्ट्र (න) | - රට |
| अम्बु (න) | - ජලය | वल्मीक (න) | - තුඹස |
| उपल (න) | - ගල | शकट (න) | - කරත්තය/ගැල |
| नावा (ස්ත්‍රී) | - නැව | शाला (ස්ත්‍රී) | - ශාලාව |
| वसुधा (ස්ත්‍රී) | - පොළොව | सभा (ස්ත්‍රී) | - සභාව |
| शाखा (ස්ත්‍රී) | - අත්ත | छाया (ස්ත්‍රී) | - සෙවණ/පිළිබිඹුව |

**භාවිතයට**

**धर्मादर्थः प्रभवति - धर्मात् प्रभवते सुखम् ।**
**धर्मेण लभते सर्वं - धर्मसारमिदं जगत् ॥**

ධර්මයෙන් අර්ථය ලැබේ. ධර්මයෙන් සැපය ද උපදී. ධර්මයෙන් සියල්ල ලබයි. මේ ලොව ම ධර්මයේ හරය වෙයි.

**लोभात् क्रोधः प्रभवति - लोभात् कामः प्रजायते ।**
**लोभात् मोहश्च नाशश्च - लोभः पापस्य कारणम् ॥**

ලෝභයෙන් ක්‍රෝධය හටගනී. ලෝභයෙන් කාමය ඇති වේ. ලෝභයෙන් මුළාව ද විනාශය ද සිදු වේ. ලෝභය පවට හේතුව යි.